ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගෙන් සහ
ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගෙන් ඉල්ලා සිටිමු.

දිනපතා සතුන්ට සිදුවන විවිධ වූ හිංසනයන් නතර කරමින් ඔවුන්ව ආරක්ෂා කිරීමට ශ්‍රී ලාංකිකයින් ලෙස අප විසින් ශක්තිමත් නීතිමට ප්‍රතිපාදන ඇති කිරීම අත්‍යවශ්‍ය වන අතර ඒ වෙනුවෙන් සංශෝධනය කරන ලද නව සත්ත්ව ශුභ සාධන කෙටුම්පත ඇගයීමට ලක්කර එය පාර්ලිමේන්තුවේ ඉතාමත් ඉක්මනින් සම්මත කර නීතියක් බවට පත්කිරීම ඉතාමත් වැදගත් වේ.

වර්තමානයේ තිබෙන යල්පැන ගිය සත්ත්ව ශුභ සාධන කෙටුම්පත 1906 වසරේදී කෙටුම්පත් කර තිබෙන අතර නව කෙටුම්පත සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ 2006 වසරේදීයි. කෙසේවෙතත්, පසුගිය වසර 09 ක් පුරා මෙම කෙටුම්පත නීතියක් බවට පත්වීම ප්‍රමාදවී තිබේ.

මේ වනවිට වීදිවල සරන, අල්ලා සිරකරගෙන සිටින, නිවෙස්වල ඇතිකරන හෝ කැලෑවල ජීවත්වන අපගේ සතුන්ට මිනිසුන්ගෙන් බොහෝ කරදර එල්ල වෙමින් ඇත. ඔවුන් දිනපතා පහර කෑමට ලක්වීම, අපයෝජනයට ලක්වීම, ගල් මුගුරු සහ වෙඩි ප්‍රහාරයන්ට ලක්වීම, උගුල් වලට කොටුකර ගැනීම හෝ ඝාතනය කිරීම සිදුවේ. මේ නිසා, මේවා නතර කිරීම සඳහා ශක්තිමත් නීතිමය ප්‍රතිපාදන අවශ්‍ය වන අතර මේ වනවිට තිබෙන සංශෝධිත සත්ත්ව ශුභ සාධන කෙටුම්පත මේ සඳහා ප්‍රමාණවත් නොවේ.

නව සත්ත්ව ශුභ සාධන කෙටුම්පතේ අරමුණු පහත පරිදිය-

01.සතුන්ගේ ප්‍රධානියා ලෙස කටයුතු කරන තැනැත්තාගේ රාජකාරියේ කොටසක් ලෙස සතුන්ව ආරක්ෂා කරගැනීමත් ඔවුන්ට මානුෂීයව සැලකීමත් වගකීමක් ලෙස හඳුනා ගන්නා අතර මෙම සතුන්ගේ ශුභ සාධනය වෙනුවෙන් අවශ්‍ය සියළු සාධාරණ පියවර ගැනීම.

02. සතුන්ට එරෙහි කෲරත්වය වලක්වමින් ඔවුන්ගේ ආරක්ෂාව සහ ශුභ සාධනය තහවුරු කිරීම.

03. සතුන්ට එරෙහිව සිදුවන කැපී පෙනෙන ක්‍රියාකාරකම් තහනම් කරමින් නීතිය කඩ කරන්නන්ට දඬුවම් ලබාදීම.

04. ජාතික සත්ත්ව ශුභ සාධන අධිකාරියක් පිහිටුවීම සහ සතුන්ට සිදුවන කෲරත්වය වැලැක්වීමටත් සත්ත්ව ශුභ සාධන ඇති කිරීමටත් අවශ්‍ය වන රෙගුලාසි සහ අචාර ධර්ම ඇති කිරීම.

05. සත්ත්ව ශුභ සාධනය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සහ

06. සතුන්ට එරෙහි කෲරත්වය වැලැක්වීමේ යල්පැන ගිය පනත අහෝසි කිරීම.

අප වෙනුවෙන් පමණක් නොව අපගේ රටේ ජීවත්වන සියළුම සත්ත්වයන් වෙනුවෙන්

රැකවරණය ලබාදිය යුතු කාලය මේ වනවිට පැමිණ තිබේ. හඬක් නැගිය නොහැකි අහිංසක සතුන් වෙනුවෙන් මෙම වෙනස කිරීමට අවශ්‍ය වන රැල්ලක් මේ වනවිට නිර්මාණය වෙමින් තිබෙන අතර පුරවැසියන් ලෙස අපට අවශ්‍ය වන්නේ ආදරය, කරුණාව සහ රැකවරණය ඇති රටක ජීවත් වීමටයි.

ශ්‍රී ලංකාව මෙන් විවිධත්වයකින් යුත් සතුන් සිටින්නේ ලෝකයේ රටවල් කිහිපයක පමණක් වන අතර මේ නිසා මෙම වටිනා සම්පත ආරක්ෂා කර ගනිමින් ඔවුන්ට ගෞරව කිරීමත් ඔවුන්ට උරුම ජීවිතය ලබාදීමත් අපගේ වගකීමකි. මෙවැනි වෙනසක් කිරීම මගින් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභයක් හිමිවෙනවා සේම අපගේ රට ජාත්‍යන්තර ප්‍රසාදයටද ලක්වේ. ශ්‍රී ලංකාව සැබෑ ලෙසම කරුණාවන්ත ජාතියක් ජීවත් වන රටක් ලෙස සලකන්නේ නම් මිනිසුන් මෙන්ම සතුන් වෙනුවෙන්ද අපගේ තිබෙන කැපවීම ප්‍රදර්ශනය කළ යුතුවේ. මේ නිසා, ඉදිරි පරම්පරාව වෙනුවෙන් සතුන්ගේ ජීවිතවල යහපත් වෙනසක් ඇතිකිරීමට සමත් වර්තමාන පරම්පරාවක් අපට අවශ්‍යවේ